# ජ වි පෙ ට තර්ජනයක්

ඒකාබද්ධ යාන්ත්‍රණයක් ඇතිකිරීමට බටහිරයන් තීරණයකර අවසාන ය. මෙහි දී බටහිරයන් යන්නෙන් ජපානය ඇතුළු බටහිර රටවල දේශපාලන ආධිපත්‍යයට හසුවූවන් ද අදහස් කෙරෙන බව අවධාරණය කළ යුතු ය. මහනුවර පවත්වන ලද ඊනියා සංවර්ධන මණ්ඩපයෙහි හෙවත් ඊනියා ආධාර මණ්ඩල රැස්වීමෙහි දී ඩොලර් බිලියන විසිදෙකකට අධික මුදලක් ලබාදීමට බටහිරයන් පොරොන්දු වී ඇත. මෙය පොරොන්දුවක් පමණක් බවත් මේ ණය මුදල පවා අපට ලැබෙන්නේ අප බටහිරයන්ගේ දේශපාලන, සංස්කෘතික හා ආර්ථික කොන්දේසිවලට යටත්වන්නේ නම් පමණක් බවත් ජනාධිපතිනියත් මුදල් ඇමතිවරයාත් වෙන කාහටත් වඩා හොඳින් දනියි.

දැන් ජනාධිපතිනියට හා ඇතැම් ඇමතිවරුන්ට අවශ්‍ය වී ඇත්තේ කෙසේ හෝ මේ ණය මුදල ලබාගැනීමට ය. ඒ සඳහා රටේ ස්වෛරීභාවය වුවද පාවාදීමට ඔවුහු සූදානමින් සිටිති. බටහිරයන් සුනාමිය දේවාශිර්වාදයක් ලෙස සලකන බව ද රහසක් නො වෙයි. ඔවුන් දන්නා කරුණ නම් ඊනියා සුනාමි ආධාර මුවාවෙන් දේශපාලන, ආර්ථික හා සංස්කෘතික කොන්දේසි දූප්පත් රටවල් මත පැටවිය හැකි බව ය. ඉන්දියාව බටහිරයන්ගේ සුනාමි ආධාර ප්‍රතික්ෂේප කෙළේ නිකමට නො වෙයි. ජනාධිපතිනිය ප්‍රමුඛ ඇතැම් ඇමතිවරු ශ්‍රී ල නි පාක්ෂිකයන් වන්නේ නමට පමණකි. ඔවුන්ගෙන් සමහරුන්ගේ දේශපාලනය මහජන පක්ෂයේ දේශපාලනය වෙයි. තවත් සමහරු බොරු ලිබරල්වාදියෝ වෙති. එ ජා ප දේශපාලනයේ යෙදෙන ඇමතිවරු ද වෙති.

බටහිරයන්ගේ බලපෑම් නැතත් මොවුහු ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණයට පක්ෂවෙති. බලපෑම් හමුවේ ඔවුන්ට ධෛර්යයක් ද ලැබෙයි. බටහිරයන් තමන් පිටුපස සිටින බව ඔවුහු දනිති. එබැවින් යාන්ත්‍රණයට විරුද්ධවූවන් මර්දනයකර හෝ දෙමළ ජාතිවාදයට ඒ ලබාදීමට ඔවුහු කටයුතු කරති. අද යාන්ත්‍රණයට විරුද්ධ දේශපාලන පක්ෂ ලෙස ගතහැක්කේ ජ වි පෙරමුණ, ජාතික හෙළ උරුමය, මහජන එක්සත් පෙරමුණ හා භූමිපුත්‍ර පක්ෂය ය. එයට අමතරව විවිධ ජාතික සංවිධාන යාන්ත්‍රණයට විරුද්ධ වෙයි.

ඩග්ලස් දේවානන්ද මහතා නායකත්වය දරණ ඊපීඩීපීය පසුගිය දා යාන්ත්‍රණයට පක්ෂව ප්‍රකාශයක් නිකුත්කර තිබුණි. මෙහි තේරුම කුමක් ද? ඇතැමුන්ට අනුව ඊපීඩීපිය යාන්ත්‍රණයට පක්ෂවන්නේ කොටි සංවිධානය කල්යල් බලා එයට විරුද්ධවන බව දන්නා බැවින් ය. ඔවුන්ටත් ඩග්ලස් දේවානන්ද මහතාටත් අනුව කොටි සංවිධානය ක්‍රම ක්‍රමයෙන් ඉටුකිරීමට නොහැකි කොන්දේසි ආණ්ඩුවට ඉදිරිපත්කරනු ඇත. එවිට ඒකාබද්ධ යාන්ත්‍රණය පිහිටුවීම අපහසු කාර්යයක් වෙයි.

ඇතැම්විට ඒ එසේ සිදුවිය හැකි ය. එහෙත් ප්‍රභාකරන් ඊනියා අවබෝධතා ගිවිසුමට එකවර නොවුවත් රනිල් වික්‍රමසිංහ මහතා සමග අත්සන් කෙළේ ය. බටහිරයන්ගේ බලපෑම ආණ්ඩුවට මෙන් ම කොටි සංවිධානයට ද වන බව අප අමතක නොකළ යුතු ය. විශේෂයෙන් ම අද කොටි සංවිධානයේ නායකත්වයේ ඉදිරියට පැමිණ සිටින තමිල්සෙල්වම්ට බටහිරයන්ගේ ඇති බලපෑම අධික ය. කුල භේදය තදින් ක්‍රියාත්මකවන යාපන අර්ධද්වීපයේ කරණැවෑම් කුලයට අයත් තමිල්සෙල්වම්ට දෙමළ ජනයාගේ නායකත්වය ගතහැකි යැයි සිතිය නො හැකි ය. ඔහුට තවතවත් බටහිරයන්ගේ පිහිට පැතීමටත් ඒ ඔස්සේ බටහිරයන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් තදින් පෙනී සිටීමටත් සිදුවීම වැළැක්විය නොහැකි ය.

මෙහි දී කිවයුතු කරුණක් වෙයි. අද ඊනියා වමේ නායකයෝ ද බොරු සිවිල් සමාජකාරයෝ ද බටහිරයන් වෙනුවෙන් පෙනී සිටිති. මේ බොරු සිවිල් සමාජකාරයන් අතර සිංහල මෙන් ම දෙමළ උගත්තු ද වෙති. මේ දෙමළ උගතුන්ගෙන් ඇතැමෙක් වෙල්ලාල කුලයට අයත්වූවෝ වෙති. ඔවුන් බටහිරයන් වෙනුවෙන් පෙනී සිටින්නේ තමිල්සෙල්වම් පෙනී සිටින ආකාරයට ම නොවන බව පැහැදිලිකරගත යුතු ය. සිංහල මෙන් ම දෙමළ සිවිල් සමාජකාරයන්ට අද වම දකුණ වෙන්කරගැනීම ප්‍රශ්නයක් වී ඇත. කොළඹ විශ්ව විද්‍යාලයෙන් මා අස්කළ අවස්ථාවෙහි මට මා සාමාජිකත්වය දැරූ වෘත්තීය සමිතියට කරුණු ඉදිරිපත්කිරමේ අවස්ථාව නොදුන් මේ එක් නිවටයෙක් අද සති අන්ත පත්තර කඩමාල්ලක ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් ගැන කතාකරයි. මේ පත්තර කඩමාල්ලේ අද ඊනියා ශාස්ත්‍රීය සංවාදයක

© Prof. Nalin De Silva

යෙදෙමින් බටහිරයන්ගේ මත වමාරමින් කන්නෝ වම දකුණ හඳුනාගැනීමට නොහැකි ව ලතවෙති. හඳුනාගැනීමට වමක් හා දකුණක් නැත. ඇත්තේ ජාතිකත්වය හා විජාතිකත්වය ය. මේ කසිකබල් උගතුන් අද වම දකුණ හඳුනාගැනීමට නොහැකිව කිව යුත්තේ ජාතිකත්වය අධිනිශ්චය වී ඇති බව ය. මේ කසිකබලුන් යොදාගන්නා නිශ්චය යන වචනය ම ඩිටර්මින් යන ඉංගිරිසි වචනයෙහි පරිවර්තනයක් නො වෙයි.

කෙසේ වෙතත් ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණය පිහිටුවා ක්‍රියත්මකකිරීමට බටහිරයන්ට හා ආණ්ඩුවේ ඇතැමුන්ට ඇති අවශ්‍යතාව හමුවේ එයට විරුද්ධ වූ පක්ෂවලට තර්ජන එල්ලවීමට ඉඩකඩ ඇත. ජ වි පෙ හා ජා හෙළ උරුමය අද යාන්ත්‍රණයට විරුද්ධ දේශපාලන පක්ෂ අතර කැපී පෙනෙයි. ඒ පක්ෂවල නායකයන් අවංකව ම ජාතිකත්වය ගැන කතාකරන්නේ ද යන්න පිළිබඳ ප්‍රශ්න ඇතත් අද ශ්‍රි ල නි පක්ෂ නායකත්වය සිංහලත්වයට විරුද්ධ වෙමින් ඒ පක්ෂයට උරුම වූ ගමන් මගින් වෙනස්වන විට ශ්‍රී ල නි ප සාමාජිකත්වය ජාතිකත්වය ගැන කතාකරන අනෙක් පක්ෂ දෙස බැලීම පුදුමයක් නො වේ. අද ශ්‍රී ල නි ප නායිකාව ක්‍රියාකරන්නේ යන යකා කොරහ බිඳගෙන යන ආකාරයෙන් ය. බටහිරයන්ගේ අවශ්‍යතාව ඉටුකිරීමට ශ්‍රී ල නි ප විනාශකිරීම වුව ද ප්‍රශ්නයක් නොවන බව පෙනී යයි. සියල්ලට මුල සිංහල බෞද්ධයන් යැයි කියන ඊනියා සිංහල නායක නායිකාවන් සිංහලයන්ට දෙන ලද්දේ බ්‍රිතානීන් විසින් ය.

ඒකාබද්ධ යාන්ත්‍රණය පිහිටුවීම සඳහා අද ජ වි පෙ විනාශකිරීමට වුව ද බටහිරයන් පසුබට නොවනු ඇත. එහි දී ඇතැම් විට මුල් වටයේ දී බටහිරයන් ජාතික හෙළ උරුමය පවා යොදාගැනීමට ඉඩ ඇත. අද අවශ්‍ය වන්නේ යම් කලබලයක් නිර්මානය කර එහි වගකීම ජ වි පෙරමුණ මත පැටවීම ය. ඉන් පසු 1987 - 90 කාල පරිච්ඡෙදයෙහි මෙන් මුල් වටයෙහි දී ජ වි පෙරමුණත් දෙවැනි වටයේ දී ජාතික හෙළ උරුමයත් විනාශකිරීමට කටයුතුකිරීම බටහිරයන්ට හා ඔවුන්ගේ ගැත්තන්ට මහා ප්‍රශ්නයක් නොවනු ඇත.

පසුගිය දා තාරකී හෙවත් සිවරාම් ඝාතනයකරනු ලැබූ අවස්ථාවේ දී එහි වරද ජ වි පෙ මත පැටවීමට ඇතැම්හු උත්සාහ ගත්හ. අද වනතුරුත් සිවරාම්ගේ මිනීමරුවා හෝ මිනීමරුවන් හෝ සොයාගෙන නැත. ඊපීඩීපී නායකයා කියන්නාක් මෙන් ඒ සමහර විට කොටි සංවිධානය විය හැකි ය. ඔහු කියන්නේ සිවරාම් තම ජීවිතයේ අවසාන කාලයෙහි යම් ප්‍රමාණයකට කොටි සංවිධානය විවේචනය කළ බව ය. කෙසේ වෙතත් මෙරට ඊනියා මාධ්‍යවේදීන් උත්සාහ කෙළේ වරදකරුවා සිංහල ජාතික සංවිධාන බව පෙන්වීමට ය. එහෙත් ඒ උත්සාහයේ මල්ඵල නෙලාගැනීමට නො හැකිවිය. එහෙත් එහි වෙනත් ඵල නම් තිබුණාට සැකයක් නැත.

පසුගිය දා ඇති වී යැයි කියන ඨෙරපුත්තාභය ඒකකය ද ජ වි පෙ මත පැටවීමට උත්සාහයක් ගැණිනි. මෙවැනි ඒකකයක් තිබේනම් ඇත්තේ කොහේද යන්න බොරු සිවිල්සමාජකාරයන් නොදන්නවාට මෙරට ස්වාධීනත්වය පාවාදීමට කටයුතුකරන අනෙක් පිරිසකට රහසක් නොවිය හැකි ය. මේ සියල්ලෙන් කියැවෙන්නේ එක් කරුණකි. අද ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණය පිහිටුවීමට උත්සාහ දරන්නන්ට ඒ කෙසේ හෝ පිහිටුවීමට අවශ්‍ය බව පැහැදිලි ය. එයට හේතුව මේ බොහෝ විට අවසන් අවස්ථාව වීමට ඇති ඉඩකඩ ය. යාන්ත්‍රණය ඇතිකිරීමට නොහැකිවුවහොත් බොහෝ විට නැවත ඊළමකට මග පාදාගැනීම අපහසු වනු ඇත. එබැවින් යාන්ත්‍රණය පැරදවීම ජාතිකවාදීන්ගේ වගකීමය.

සුනාමිය වෙස්වලාගෙන පැමිණි දේවාශිර්වාදයක් ලෙස සලකන්නන්ගේ න්‍යාය පත්‍රවල ඇත්තේ කුමක්දැයි නිශ්චිතව ම කිව නොහැකි වුවත් සුනාමිය ගමන්කරන්නේ කිනම් දිශාවකට ද යන්න පැහැදිලි ය. ජ වි පෙරමුණ හා ජාතික හෙළ උරුමය අව්‍යාජ ජාතික පක්ෂ යැයි අපි නොකියමු. එහෙත් අද බටහිරයන්ට හා ඔවුන්ගේ ගැත්තන්ට ජ වි පෙ මහ හිසරදයක් වී ඇත. එබැවින් හොඳින් හෝ නරකින් හෝ ගනුදෙනු බේරාගැනීමට බටහිරයන් ඉදිරිපත්වනු ඇත.

මේ තත්ත්වය යටතේ ක්‍රියාකරන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව සියළු ජාතික සංවිධාන නැවතත් සිතා බැලිය යුතු ය. ජාතිකවාදීන් ආණ්ඩුවේ හමුදා ලවා ම මර්දනය කරවන විට බොරු සිවිල් සමාජකාරයන් ජාතිකවාදීන්ගේ මානව හිමිකම් වෙනුවෙන් කතා නොකරනු ඇත. එයට හේතුව වනුයේ මර්දනය පිටුපස සිවිලන්ගේ ස්වාමිවරුන් වූ බටහිරයන් වීම ය.